"සකසුරුවම්භාවය හා තීතිමය තත්වය"

ඌව පළාත් සභාව
ஊவா மாகாண சபை
UVA PROVINCIAL COUNCIL

ඌව පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண உள்ளக கணக்காய்வுத் திணைக்களம்
Department of Internal Audit - Uva Province

රජ වීදිය, බදුල්ල. - இராஜ வீதி, பதுளை. - King's Street, Badulla.
E-mail - uvainternalaudit@gmail.com

Provincial Productivity Awards 2011/2012 | COPA 2015 | COPA 2016

ඔබේ අංකය / உமது இல. / Your No. ……………

මගේ අංකය / எனது இல. / My No. UPC/IA/ACC/02/01-1

දිනය / திகதி / Date 2025.05. 26

ඌව පළාතේ සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,

නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්,

දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

<u>අභ්‍යන්තර විගණන මාර්ගෝපදේශ</u>

භාණ්ඩාගාර ලේකම් විසින් 2025.04.28 දාතමින් නිකුත් කර ඇති, උක්ත කරුණ සම්බන්ධ කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක DMA/01/2025 සම්බන්ධවයි.

02. එම චක්‍රලේඛයේ 2-1 කරුණ අනුව හා ඇමුණුම 01හි II හා III හි සඳහන් ආකාරයට සියලුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා කාර්යාල මට්ටමින් පවත්වනු ලබන විගණන හා කළමනාකරණ කමිටු සඳහා සංයුතිය හා ගණපූර්ණය පවත්වා ගනිමින් එහි සඳහන් අරමුණු හා කාර්යයන් පවත්වා ගැනීමට කටයුතු කළ යුතු බව සඳහන් කරමි.

03. තවද එහි 2:2හි සඳහන් ආකාරයට සෑම කාර්තුවක් සඳහාම විගණන හා කළමනාකරණ කමිටු සියලුම ආයතන ප්‍රධානීන් විසින් පැවැත්වීමට කටයුතු කළ යුතු අතර, එම චක්‍රලේඛයේ 2:3හි සඳහන් ආකාරයට ඇමුණුම් 03 ආදර්ශ ආකෘතියද උපයෝගී කර ගනිමින් න්‍යාය පත්‍රය සකස් කර රැස්වීම් සඳහා අවශ්‍ය කටයුතු සලසා ගත යුතු බවද සඳහන් කරමි.

04. එමෙන්ම එම චක්‍රලේඛයේ සඳහන් ආකාරයට ඇමුණුම් 04 ආදර්ශ ආකෘතියද පදනම් කර ගනිමින් වාර්තාව සකස් කර, රැස්වීම් පවත්වා සති 02ක් තුළ ඉදිරිපත් කළ යුතු බවද, එම කමිටුවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය එළඹෙන කාර්තුව ආරම්භ වී සති 02කට පෙරද මෙම කාර්යාලය වෙත ලැබීමට සැලැස්විය යුතු බව සඳහන් කරමි.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary 055-2222809 Fax: 055-2223977
අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ / உள்ளக கணக்காய்வுப் பணிப்பாளர் / Director Internal Audit 055-2223593 Fax: 055-2223593
පරිපාලන නිලධාරී / நிர்வாக அலுவலர் / Admin. officer 055-2233513

05. තවද අදාල චක්‍රලේඛයේ ඇමුණුම් 01හි 4-II හා III ප්‍රකාරව ආයතනයේ අභ්‍යන්තර විගණන විෂය භාර මාණ්ඩලික නිලධාරියා විසින් මා සමඟ හෝ මෙම දෙපාර්තමේන්තුවේ පරිපාලන නිලධාරි සමඟ සාකච්ඡා කර විගණන හා කළමනාකරණ කමිටුව පැවැත්විය යුතු දිනය නිශ්චය කර ගැනීමෙන් අනතුරුව ඒ සඳහා කැඳවුම්කරු ලෙස අවශ්‍ය කටයුතු සැලසිය යුතු බවත් වැඩිදුරටත් සඳහන් කරමි.

06. එමෙන්ම පහසුව සඳහා අදාළ චක්‍රලේඛයේ පිටපතක් ඔබගේ ආයතනයේ ඊමේල් ලිපිනය වෙත යොමු කරන බවද කාරුණිකව දන්වා සිටිමි.

සමන්ත කිත්සිරි
අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ